# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

AAT/ 130/2022(PSC)

**ඩී.පී.සමරකෝන්,**

අභියාචක

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වගඋත්තරකරු

දිනය :- **2025.04.24**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමලත් රජයේ සේවක එම්.කරපුටුගල මහතා,

වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.මනිෂා නිශ්ශංක මෙනවිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා,**

## -<u>නියෝගය</u>-

බන්ධනාගාර නියාමක පී.ඩී.සමරකෝන් නැමැති අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ **2022.10.06** දිනැති ලිපියේ සඳහන් කර ඇති පරිදි, එකී කොමිෂන් සභාව විසින් ඔහුගේ අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට ගෙන ඇති තීරණයට එරෙහිව මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත. ඉහත කී **2022.10.06** දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණය ඉදිරිපත් කර ඇත්තේ, බන්ධනාගාර කොමසාරිස් (පාලන) විසින් අත්සන් තබන ලද **2021.09.29** දිනැති ලිපියෙහි සඳහන් කර ඇති විනය නියෝගය

සම්බන්ධයෙනි. එකී විනය නියෝගය මගින් තීරණය කර ඇත්තේ, අභියාචකට විරුද්ධව පැවැති විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස අභියාචක සේවයෙන් පහකර තිබීමයි. ඉහත කී විනය පරීක්ෂණය, අභියාචකට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා 04ක් යටතේ පවත්වා ගෙන ගොස් ඇත. එකී චෝදනා පත්‍රය පහත දැක්වේ.

01. ඔබ බන්ධනාගාර මූලස්ථානයේ බුද්ධි හා ආරක්ෂක ඒකකයට අනුයුක්තව රාජකාරියේ යෙදී සිටියදී 2014.07.01 වන දින ප.ව.12.30 ට හෝ ආසන්න වේලාවකදී නිසි අවසරයකින් තොරව සිවිල් ඇඳුමින් සැරසීම හා නිසි අවසරයකින් තොරව රාජකාරී ස්ථානයෙන් බැහැරව යාම සහ එදින නැවත රාජකාරී ස්ථානය වෙත වාර්තා නොකිරීමෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ජේදයේ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202(IV)(ඒ) උල්ලංඝණය කිරීම.

02. 2014.07.01 වන දින ඔබ බන්ධනාගාර මූලස්ථානයේ බුද්ධි හා ආරක්ෂක ඒකකයට අනුයුක්තව රාජකාරියේ යෙදී සිටියදී ප.ව.1.00 සිට 2.30 දක්වා කාලය තුල හෝ ඊට ආසන්න වේලාවකදී ආයතනයෙන් බැහැරව පිහිටි බොරැල්ල නගරයේ උමං මාර්ගයේදී සොරකම් කිරීමේ චේතනාවෙන් හෝ වෙනත් අදහසකින් කාන්තාවකගේ ගෙල බැඳි මාලයක් කඩා ගැනීමෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ජේදයේ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202(I)(ඒ)(III) උල්ලංඝණය කිරීම.

03. ඉහත චෝදනා අංක 1 හෝ 2 හි සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශ ලබාදීමෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි

පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ 15 වන වගන්තිය යටතට ගැනෙන දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202(V) උල්ලංඝණය කිරීම.

04. ඉහත චෝදනා අංක 1, 2, හා 3 හි සඳහන් වරදවල් සියල්ලම හෝ කීපයක් හෝ එකක් හෝ සිදුකිරීම මගින් හෝ රාජකාරියෙන් විධිමත්ව මුදා නොහැර සිටියදී ප්‍රසිද්ධ ස්ථානයකදී මහජනයා ඉදිරිපිට පොලිස් අත්අඩංගුවට පත්වීමෙන් හෝ ඉහත සිදුවීම පුවත්පත් හා අනෙකුත් ජනමාධ්‍ය මගින් ප්‍රසිද්ධ වන පරිදි හැසිරීම මගින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් රාජ්‍ය සේවයත් අපකීර්තියට පත්වීම තුලින් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ 10 වන වගන්තිය උල්ලංඝණය කිරීම.

එකී චෝදනා 04 මත පවත්වා ගෙන ගිය විනය පරීක්ෂණය අවසානයේ එකී චෝදනා 04 ටම අභියාචක වැරදිකරු බව, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා විසින් තීරණය කර ඇත. එකී තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එකී අභියාචනය නිශ්ප්‍රභ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද තීරණය කර ඇත.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයෙහි නිරවද්‍යතාවය පරීක්ෂා කර බලමි. ඉහත සඳහන් කර ඇති චෝදනා 4 ටම පදනම වී ඇත්තේ අභියාචක විසින් බොරැල්ල නගරයේ පිහිටා ඇති උමං මාර්ගය තුලදී, සොරකම් කිරීමේ චේතනාවෙන් හෝ වෙනත් අදහසකින් කාන්තාවකගේ ගෙල බැඳි මාලය කඩා ගැනීම සහ නිසි අවසරයකින් තොරව රාජකාරී ස්ථානයෙන් බැහැරව යාම යන කරුණුය. විධිමත් විනය පරීක්ෂණය සඳහා එකී සිද්ධියට භාජනය වූ කාන්තාව සාක්ෂි ලබා දී නැත. එම විනය පරීක්ෂණයේ දී සාක්ෂි ලබා දී ඇත්තේ පො.කො.76904 චමින්ද රංගන, පො.කො.69655 අනිල්

කිර්තිසිංහ, අශෝක සිරිසේන, විශ්‍රාමික ජේලර් අජිත් රෝහන පෙරේරා, ජේලර් ලයනල් වික්‍රමසිරි යන අයවළුන් ය. විනය පරීක්ෂණයේ දී අභියාචක වෙත සාක්ෂි ලබාදීමට අවස්ථාව ලබා දුන්නද, ඔහු එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන නැත. ඒ වෙනුවට ඔහු සඳහන් කර ඇත්තේ ලිඛිත ප්‍රකාශයක් ලබාදෙන බවයි. මේ අනුව ඉදිරිපත් වී ඇති සාක්ෂි පරීක්ෂා කර බලමි.

චමින්ද රංගන නැමැති සාක්ෂිකරු පවසා සිටියේ **"මාගේ රාජකාරි කාලය අවසන් අවස්ථාවේ 13.55 ට පමණ තවත් පොලිස් නිලධාරියෙකු වන 69555 කීර්තිසිංහ සමඟ බොරැල්ල පොලිසිය දෙසට එමින් සිටියා. එම අවස්ථාවේ වෝඩ් පෙදෙස දෙසට මුහුණලා පිහිටි උමං මාර්ගයෙන් ඇතුළට ප්‍රවේශ වන අවස්ථාවේ දී පිරිසක් කෑ ගසමින් දුවගෙන ගියා මාලයක් කඩා ගත්තා කියලා. අපි පැමිණෙන දෙසටමයි ඔවුන් කලබැගෑනියෙන් ආවේ. අපි ඇහුවා එම පැමිණෙන අයගෙන් මොකක්ද වුනේ කියලා. එතකොට ඔවුන් කීවා ගෑනු කෙනෙකුගේ මාලයක් කඩා ගෙන කවුද කෙනෙක් වෝඩ් පෙදෙස පැත්තට දිව්වා කියලා. එවිට අපි ඇහුවා මොනවගේ ඇඳුමක් ඇඳ ගෙන ද ගියේ කියලා. එවිට ඔවුන් කිව්වා කොල පාට ටීෂර්ට් එකක් හා සුදු පාට ඩෙනිම් කලිසමක් ඇඳ ගත්ත කෙනෙක් කියලා. එවිට අපි ඒ දෙසට දිව්වා. එවිට මීටර් 50ක් පමණ දුරින් එවැනි කෙනෙක් වෝඩ් පෙදෙස පැත්තට දුවනවා දැක්කා. අප හා දුවන පුද්ගලයා අතර පරතරය වැඩි නිසා ඒ දෙසට යන ත්‍රීවිලර් රථයක් නවතා අපි දෙදෙනා ඔහු හඹා ගියා. දිව ගිය පුද්ගලයා වෝඩ් ප්‍රදේශයේ සිට මරදාන හරස් පාරට හැරුණා. ඒ අවස්ථාවේ දී අපි ත්‍රීරෝද රථය නවතා පුද්ගලයව අල්ලා ගත්තා. ඔහු අත් අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ දී ඔහුගේ අතේ, කෙළවරක් කැඩුණු මාලයක් තිබුණා. එම පුද්ගලයාව අපි දෙදෙනා විසින් අත් අඩංගුවට ගෙන පා ගමනින් බොරැල්ල පොලිසියට පැමිණියා. ඔහුව බොරැල්ල පොලිසියේ අපරාධ අංශය වෙත**

**හාරදුන්නා. පොලිසියට රැගෙන ගොස් ප්‍රශ්න කරන අවස්ථාවේ දී මට දැන ගන්නට ලැබුණා මොහු බන්ධනාගාරයේ සේවය කරන අයෙකු බව. ඒ පුද්ගලයා මට හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවා. අද දින මෙම පරීක්ෂණ සභාවේ පෙනී සිටින සමරකෝන් නැමැති බන්ධනාගාර නිලධාරියා ඉහත පරිදි මෙම සිද්ධියේ දී අත් අඩංගුවට පත් පුද්ගලයා බවට නිශ්චිතවම අනන්‍යතාවය හඳුනා ගත හැකි බව ප්‍රකාශ කරමි.**"

අභියාචක වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ද අසා ඇත. ඒ අනුව ඔහු හරස් ප්‍රශ්න වලදී පිළිතුරු ලෙස ප්‍රකාශ කර ඇත්තේ, කඩාගත් මාලය සමරකෝන් නැමැති පුද්ගලයා අත් අඩංගුවට ගත් අවස්ථාවේ ඔහු අත තිබී ඔවුන්ට හමුවූ බවයි.

තවත් සාක්ෂිකරුවෙකු වූ අනිල් කීර්තිසිංහ නැමැති පොලිස් නිලධාරියාගේ සාක්ෂියෙන් ඔහු විසින් මෙසේ ප්‍රකාශ කර ඇත. "**එදින අපගේ සේවා මුරය නිම කර පස්වරු 1.50ට පමණ ආපසු බොරැල්ල පොලීසියට මරදාන පාරේ දකුණු පස පෙදෙස පිහිටි උමං මාර්ගය හරහා එන විට, උමං මාර්ගයට ප්‍රවේශ වනවාත් සමඟම උමං මාර්ගයේ ඇතුලේ සිට එක් අයෙකු වෝඩ් පෙදෙස දෙසට වේගවත්ව දුවමින් ගිය අතර, තවත් පිරිසක් ඒ සමඟම දුවගෙන ආවා. ඒ අයගෙන් අප ඇසුවා ඇයි දුවන්නේ කියලා. එවිට මමත් රංගනත් ආපසු වෝඩ් පෙදෙස දෙසට එළියට පැමිණ බලන විට එක් අයෙකු කොල පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන මීටර් 50ක පමණ දුරින් දුවනවා දක්කා. එවිට අපි ත්‍රීරෝද රථයක් නවත්වා එහි නැගී  දුවන පුද්ගලයා දෙසට ගියා. එවිට අපි දුටුවා දිව ගිය පුද්ගලයා වෝඩ් පෙදෙසින් දකුණු පැත්තේ හරස් පාරට හැරෙනවා. අපි ත්‍රී විල් රථයෙන් ඔහු ලුහු බැඳ ගොස් ඔහු වෙත පැමිණි වහාම පොලිස් නිලධාරී රංගන මහතා එළියට පැන පුද්ගලයා අල්ලා ගත්තා. එවිට ඔහු අතේ රන් පැහැයට හුරු මාලයක් තිබුණා. එම මාලය කෙලවර**

**කොක්කෙන් ඇදී අවුත් ගැලවී තිබූ අතර, සම්පූර්ණ මාලය ඔහු ළඟ තිබුණා. අනතුරුව අල්ලා ගත් පුද්ගලයා මාලයත් සමඟ පොලීසියට රැගෙන ගියා.**"

අභියාචක වෙනුවෙන් මෙම සාක්ෂිකරුගෙන් අසන ලද හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලෙස ඔහු පවසා ඇත්තේ, **එසේ කඩා ගත් මාලය සැකකරු දිව යමින් සිටියදී අප විසින් අත් අඩංගුවට ගත් අතර එසේ ලබා දුන්නේ, අප විසින්** "***කෝ කඩාගත් මාලය***" යැයි විමසීමෙන් අනතුරුව යනුවෙනි.

මේ අනුව ඉදිරිපත් කර ඇති දෙවෙනි චෝදනාව ඔප්පු කිරීමට අවශ්‍ය සාක්ෂි, ඉතාමත් වැඩිබරකින් යුක්තව ඉදිරිපත් වී ඇති බව පැහැදිලිවේ. මෙම සාක්ෂි ප්‍රතික්ෂේප කළ නොහැක. එම තත්ත්වය සළකා බැලීමේ දී විනය පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචක දෙවන චෝදනාවට වැරදිකරු කිරීමේ දෝෂයක් නොමැති බව පෙනී යයි.

පළවන චෝදනාවෙන් චෝදනා කර ඇත්තේ නිසි අවසරයකින් තොරව, රාජකාරී ස්ථානයෙන් පිටව යාම සහ එදින නැවත රාජකාරී ස්ථානය වෙත වාර්තා නොකිරීමයි. මෙම කරුණ ද, බන්ධනාගාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද වාචික සාක්ෂි සහ ලේඛනගත සාක්ෂි මඟින් ද පැහැදිලිව ඉදිරිපත් කරමින් තහවුරු කර ඇත. මෙම සාක්ෂි පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එකී සාක්ෂි පිළිගනිමින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති පලවන චෝදනාවට ද වැරදිකරු බවට පත්කිරීමේ දෝෂයක් පෙනෙන්නට නැත.

තුන්වන සහ හතරවන චෝදනාද ඉහත කී ප්‍රථම චෝදනා දෙක මත ඉදිරිපත් කර ඇති චෝදනාවන් ය. එබැවින් 3, 4 චෝදනා දෙක සම්බන්ධයෙන් අභියාචක වරදකරු බවට පත්කිරීම නිවැරදි බව පෙනී යයි.

ඉහත සඳහන් හේතුන් අනුව, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් ගෙන ඇති තීරණයන් මත ක්‍රියා කරමින් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගෙන ඇති තීරණයන් හි කිසිදු

දෝෂයක් දක්නට නැත. එබැවින් එකී තීරණයන් සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කිරීමට අවශ්‍යතාවයක් නොමැති බව පැහැදිලිව පෙනී යයි.

ඉහත කී හේතුන් සළකා බලා, මෙම විනිශ්චය අධිකාරය වෙත **2022.11.08** වෙනි දිනැතිව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-